ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

**<u>ඉන්දියානු නාවික හමුදාවේ ශර්දා නෞකාව කොළඹ සංචාරයක</u>**

සුකන්‍යා පන්තියේ ගැඹුරු මුහුද නිරීක්ෂණ නෞකාවක් (OPV) වන ඉන්දියානු නාවික හමුදාවේ 'ශර්දා' නෞකාව, මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය දෑ සපයා ගැනීම සහ එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා එක් වී සිටින ශ්‍රී ලංකා හමුදා සාමාජිකයන් සඳහා ඉන්දිය යුධ හමුදාවෙන් ලබා දෙන ද්‍රව්‍ය භාර දීම සඳහා 2026 ජූනි 10-13 දිනවල කොළඹ සංචාරයක නිරත වනු ඇත. මෙම අයිතම 2026 ජූනි 16 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේ පැවැත්වෙන උත්සවයක දී නිල වශයෙන් භාර දෙනු ඇත.

2. නෞකාව ශ්‍රී ලංකාවට පැමිණි පසු නෞකාවේ අණ දෙන නිලධාරි කොමාන්ඩර් කාර්තික් සච්දේවා මහතා බටහිර නාවික ප්‍රදේශය භාර ආඥාපති රියර් අද්මිරාල් එස්. ජේ. කුමාර මහතා හමු වනු ඇති අතර නෞකාවේ කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ වෘත්තීය සහ ක්‍රීඩා අන්තර්ක්‍රියාවන්හි නිරත වනු ඇත.

3. ජාත්‍යන්තර යෝගා දිනය නුදුරේදීම යෙදෙන අතර ඒ නිමිත්තෙන් යෝගා ව්‍යායාම කායික, මානසික සහ අධ්‍යාත්මික සුවතාවය ළඟා කර ගැනීමට ඉවහල් වන ආකාරය පෙන්නුම් කරමින් නෞකාවේ කාර්ය මණ්ඩලය සහ ශ්‍රී ලංකා නාවික හමුදා සාමාජිකයන් සඳහා ඒකාබද්ධ යෝගා සැසියක් ද පැවැත්වීමට සැලසුම් කර ඇත.

5. ඉන්දිය නාවික හමුදා නෞකාවන් විසින් ශ්‍රී ලංකාවේ සිදු කරනු ලබන සංචාරයන්හි අරමුණ වන්නේ ඉන්දියාවේ 'අසල්වැසියා ප්‍රථමයෙන්' යන ප්‍රතිපත්තිය සහ අග්‍රාමාත්‍යතුමාගේ මහාසාගර් (MAHASAGAR) යන දැක්ම හා අනුකූලව මිත්‍රශීලි නාවික හමුදාවන් අතර පවතින සබඳතා වඩාත් ශක්තිමත් කිරීමයි.

****

**කොළඹ**
***2026*** ජූනි ***09***